රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 16/89

රාජ්‍ය පරිපාලන රාජ්‍ය අමාත්‍ය කාර්යාලය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
1989 මාර්තු මස 22 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ නිලධාරීන්ගේ නිවාස අවශ්‍යතා.

රාජ්‍ය පරිපාලන රාජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය රජයේ සේවය තුල පහත සඳහන් විස්තර ලබා ගැනීමට තීරණය කර ඇත.

(1) දිවයිනේ කිනම් හෝ ප්‍රදේශයක් තුල තමාට ( තම භාර්යාව හා යැපෙන දරුවන්ද ඇතුළුව) නිවසක් හෝ නිවසක් ඉදි කිරීමට සුදුසු ඉඩමක් නොමැති නිලධාරීන්ගේ නම්.

(11) දිවයිනේ කිනම් හෝ ප්‍රදේශයක් තුල තමාට ( තම භාර්යාව හා යැපෙන දරුවන්ද ඇතුළුව) නිවසක් නොමැති, එහෙත් නිවසක් ඉදි කිරීමට සුදුසු ඉඩමක් හිමි නිලධාරීන්ගේ නම්.

02. එවැනි නිලධාරීන්ට අදාළ විස්තර මේ සමග ඇති 'ඒ' ඇමුණුමේ දිවුරුම් සහතිකය මගින් 1989 අප්‍රේල් මස 15 වනි දිනට හෝ ඊට ප්‍රථම අමාත්‍යාංශයේ ලේකම්ට / දෙපාර්තමේන්තු ප්‍රධානියාට ඉදිරිපත් කළ යුතුය.

03. අමාත්‍යාංශ ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජ්‍ය සේවයේ ශ්‍රේණි ( සුළු, යටත්, මාණ්ඩලික ) අනුව ඉහත 1 වැනි ඡේදයේ (1) හා (11) යටතේ සකස් කරන ලද උප ලේඛණ 1989 අප්‍රේල් මස 30 වනදාට හෝ ඊට ප්‍රථම මෙම කාර්යාලය වෙත එවිය යුතුය.

( එම්. එන්. ජුනයිඩ් )
රාජ්‍ය පරිපාලනය පිළිබඳ රාජ්‍ය ලේකම් සහ
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

මා/21

'ඩී' ඇමුණුම.

ආකෘති පත්‍ර අංකය:

## රජයේ නිලධාරීන්ගේ නිවාස අවශ්‍යතා.

## දිවුරුම් සහතිකය.

.............................................. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ

සේවයේ නියුතු, ....................................................................
(වාසගම සහිත සම්පූර්ණ නම)

වන මම, ........................ වශයෙන් පහත දැක්වෙන
( ආගම )

පරිදි ගම්භීරතා පූර්වකවද, අවංකවද, සත්‍ය ලෙසද සහතික කොට/ දිවුරා

ප්‍රකාශ කරමි.

01. ............................................................
(සම්පූර්ණ නම)

වන මම, ඉහත නම් සඳහන් ප්‍රකාශකයා වෙමි.

02. (1) මම උත්පත්තියෙන් / ලියාපදිංචි කිරීමෙන් පුරවැසියෙක්මි.

(ii) මගේ ජාතික හැඳුනුම්පත් අංකය: .................... වේ.

03. මගේ උපන් දිනය .......................... වන දාය.

ඒ අනුව මම .................... ක් වයස ඇත්තෙක්මි.

04. මම දැනට ........................................................
ස්ථානයේ පදිංචිව සිටිමි.

05. මම විවාහකයෙක්මි. / අවිවාහකයෙක්මි.

06. මාගේ ස්වාමිපුරුෂයා / භාර්යාව රැකියාවක් කරයි. / නොකරයි.

ඔහු / ඇය .......................................හි

............................ වශයෙන් සේවයේ යෙදී සිටී.

07. මම ............................ ලෙස ....................
( තනතුර )

.................... හි සේවය කරමි. මා රජයේ සේවයට

බැඳුනේ .................... දිනය. මගෙන් යැපෙන දරුවන් ගණන

.................... කි.

08. සෑම අයුරකින්ම ලැබෙන මගේ සහ භාර්යාවගේ / ස්වාමිපුරුෂයාගේ මාසික ආදායම .......................... රු.

(1) රැකියාවෙන් : ...................................

(11) වෙනත් මාර්ග වලින්: .....................................

.............................................................

(විස්තර කරන්න.)

09. මම මගේ ස්ථිර පදිංචිය සඳහා ..................................... නගරයට / ප්‍රදේශයට තැමැත්තෙමි.

10. (1) මට නිවසක් අයිතිව ඇත./ නැත.

(11) මගේ භාර්යාවට / ස්වාමිපුරුෂයාට නිවසක් අයිතිව ඇත./නැත.

(111) මගෙන් යැපෙන්නා වන දරුවනට නිවසක් අයිතිව ඇත./ නැත.

11. (1) මට නිවසක් තැනීමට සුදුසු ඉඩමක් අයිතිව ඇත. / නැත.

(11) මගේ භාර්යාවට / ස්වාමිපුරුෂයාට නිවසක් තැනීමට සුදුසු ඉඩමක් අයිතිව ඇත. / නැත.

(111) මගෙන් යැපෙන්නා වන දරුවනට නිවසක් තැනීමට සුදුසු ඉඩමක් ඇත. / නැත.

12.

ඉහත දැක්වූ දිවුරුම් ප්‍රකාශය මවිසින් ඉහත නම් සඳහන් සිද්ධි ප්‍රකාශකයාට කියවා තේරුම්කර දෙන ලදී. තවද, ඉහත නම් සඳහන් සිද්ධි ප්‍රකාශකයාට එහි ඇතුලත් කරුණු වැටහුණු බව පෙනුනෙන්, ඒ බවට දිවුරා/ප්‍රතිඥා කොට 198 ............... මස ...... වැනිදා වන මෙදින ඔහු / ඇය විසින් මා ඉදිරියේදී අත්සන් කරන ලදී.

| රු: 2/= ක මුද්දර. |
|---|

(සිද්ධි ප්‍රකාශකයාගේ අත්සන.)

.............................................

සාමදාන විනිශ්චයකාර. (නිල මුද්‍රාව සමග )

සැ. යු.

නොගැලපෙන වචන කපා, දෙපාර්ශ්වයේම කෙටි අත්සන යෙදිය යුතුය.